**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

**14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.24 පැය 0900 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 134/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## නීති විරෝධී ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කළ සැකකරුවන් 06 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා ගෝනහේන කඳවුර.

2025.01.23 වන දින දහවල් කාලයේදී කිරිබත්ගොඩ පොලිස් වසමේ මායා මාවත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා ගෝනහේන කඳවුරේ නිලධාරින්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධී ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කල සැකකරුවන් 06 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30 ත් 47 ත් අතර වයස් වල පසුවන නුවරඑළිය, නාවලපිටිය කිරිබත්ගොඩ, බෝම්බුවල, නාරම්මල හා කුරුණෑගල යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් විසින් මත්පැන් නිෂ්පාදනය සඳහා යොදාගත් පහත උපකරණ හා අමුද්‍රව්‍ය ද පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් භාණ්ඩ :-**

1) විශේෂ අරක්කු අඩංගු 180ml ප්‍රමාණයේඅරක්කු බෝතල් 4,975 යි.
2) බුලි 12 ක දමා තිබූ සකස් කරන ලද අරක්කු ලීටර් 228 යි.
3) බැරල් 05 ක දමා තිබූ සකස් කරන ලද අරක්කු ලීටර් 228 යි.
4) සාදන ලද කැරමල් ලීටර් 3.5 යි.
5) එතනෝල් ලීටර් 110 යි.
6) 28ml ප්‍රමාණයේ වර්ණක බෝතල් 03 යි.
7) 180ml ප්‍රමාණයේ හිස් වීදුරු බෝතල් අඩංගු උර 05 යි.
8) බාකෝඩ් සහිත ලේබල් 4370 යි.
9) බෝතල්වල ඇලවීමට යොදාගන්නා මුද්‍රණය කරන ලද ලේබල් 8000 යි.
10)වතුර මෝටර් 01 යි.
11)බෝතල් මූඩි සීල් කිරීමේ යන්ත්‍ර 01 යි.
12)බෝතල් මූඩි සහිත පෙට්ටි 01 යි.
13)කරාම සහිත බැරල් 02 යි.
14)සෙලෝටේප් මැෂින් 01 යි.
15)සැර මනින උපකරණ 01 යි.
13) ජංගම දුරකථන 06

ඉදිරි නෛතික කටයුතු සඳහා ජා ඇල සුරාබදු ස්ථානයට භාර දී ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**